**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2017**

---

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 21(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයේ 32 වගන්තිය ප්‍රකාරව, ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් මැණික් ගැරීමේ ව්‍යාපෘතිවලින් ලද රු.208,885,806 ක ආදායමෙන් එම ව්‍යාපෘතිවලට අදාළ රු.82,104,236 ක වියදම හිලව් කර රු.126,781,570 ක ශුද්ධ ආදායම පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

සමාලෝචිත වර්ෂයේ දී මුදලින් ගෙවා තිබූ පාරිතෝෂික වටිනාකම රු. 10,119,925 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 8,423,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ගලායෑම් රු.1,696,925ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) ප්‍රමිතයේ 51 වගන්තිය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.36,310,655 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වාහන 14 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 34 වගන්තිය ප්‍රකාරව, දේපළ පිරියත හා උපකරණවල සාධාරණ අගය සැලකිය යුතු තරම් වන හා ඉක්මන් වෙනස්වීම් වලින් යුක්ත වන විට එම වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කල යුතු වුවත් එපරිදි කටයුතු කිරීමකින් තොරව වසර 14 කට පෙර අධිකාරිය විසින් මිලදී ගෙන තිබූ ඉඩම එහි පිරිවැය වූ රු. මිලියන 29 කට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 27 වගන්තිය ප්‍රකාරව මූල්‍ය කල්බදු ක්‍රමයට මිලදීගෙන තිබූ වාහන 03 කට අදාලව පිරිවැය ගිණුම්ගත කිරීම වෙනුවට ගෙවා තිබූ කල්බදු වාරිකවල පොලිය ද ඇතුළත් අගය වූ රු.2,228,028 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

(i) ප්‍රමිතයේ 14 වගන්තිය ප්‍රකාරව, අසම්භාව්‍ය වගකීම් සඳහා සත්‍ය ඇස්තමේන්තුව නිශ්චිතව හඳුනාගත හැකි නම් පමණක් අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදන සිදුකල වුවද එසේ නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව අසම්භාව්‍ය බැරකම් ලෙස රු.7,500,000 ක් දක්වා තිබුණි. එහෙත්, ආයතනයේ නීති අංශය විසින් විගණනය වෙත තහවුරු කල පරිදි එය රු.500,000 ක් පමණක් වුයෙන් සමුච්චිත ලාභය රු.7,000,000 ක් අඩුවෙන් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයේ විවිධ පාර්ශවයන් විසින් අධිකාරියට එරෙහිව නඩු 38 ක් පවරා තිබුණද ප්‍රමිතයේ 86 වගන්තිය පරිදි ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, සෑම ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදීම දේපළ පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ඉදිරියට ගෙන යා යුතු වටිනාකම සමාලෝචනය කර ගිණුම්වලට ගැලපීම් සිදු කරන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණද, එසේ සමාලෝචනය කිරීමකින් තොරව දේපල පිරියත හා උපකරණ, ලැබිය යුතු ශේෂ, තැන්පතු හා අත්තිකාරම් හා වෙනත් වත්කම් සඳහා සෑම වසරකම හානිකරන අලාභ ලෙස එකතුව රු.7,929,609 ක් බැගින් වූ සමාන අගයකින් ගිණුම්වලට ගැලපීම් කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 3 කට පෙර කඩා ඉවත් කරන ලද ඇහැළියගොඩ පිහිටි ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ලේ පිරිවැය වූ රු.5,460,000 ක් සහ සමුච්චිත ක්ෂය රු.3,727,466 ක් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂ 2 හිදී පිළිවෙලින් රු.109,400 ක් හා රු.1,218,000 ක් ක්ෂය වෙන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.109,400 කින්ද, රඳවාගත් ඉපයුම් රු.1,218,000 කින්ද, අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වසර ගණනාවක සිට භාවිතයේ පවතින වාහන 2 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ආදායම් බදු අධි වෙන්කිරීම රු.43,749,999 ක් ගිණුම්වලට ගැළපීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ජංගම වගකීම් යටතේ දක්වා ඇති ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් එකී ප්‍රමාණයෙන් වැඩියෙන් හා රඳවාගත් ඉපයුම් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

විදෙස් මැණික් ප්‍රදර්ශනවලට අදාල වියදම් හා අපනයනකරුවන් ලබාදී තිබූ දායකත්වය ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අගයන් සහ අපනයන අංශය විසින් ලබාදුන් වාර්තාවල ඇතුළත් අගයන් අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි.

| | මූල්‍ය ප්‍රකාශන අනුව | අපනයන අංශයේ වාර්තා අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| නිලධාරීන්ගේ විදෙස් ගමන් වියදම් | 6,067,092 | 9,673,868 | 3,606,776 |
| ප්‍රදර්ශන වියදම් | 75,348,513 | 63,119,390 | 12,229,123 |
| අපනයනකරුවන්ගේ දායකත්වය | 47,924,168 | 50,107,159 | 2,182,991 |

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජූලි 20 සිට මාස 07 ක කාලය තුල සීතාවක ගඟ අදියර III ව්‍යාපෘතියෙන් ලද මැණික් ගල් ලොට් 46 ක් පිළිබඳ විස්තර ඇතුළත් දෛනික ලේඛනය විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම මැණික් ගල් තොග සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.439,534 ක්වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය 2 ක් සහ රු.183,548 ක්වූ ගෙවුඩ තොග භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වසර 01 ත් වසර 07 ත් අතර කාලයක සිට පැවත එන අගරු චෙක්පත් 11 කට අදාල රු.239,872 ක ශේෂ අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත | |
| (i) 14 (උ) වගන්තිය | මැණික් ඉඩම් වෙන්දේසි සඳහා අධිකාරිය වෙත පැවරීමේදී ඉඩම් අමාත්‍යවරයාගේ හා පරිසර විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ අක්කර 04, රූඩ් 02, පර්චස් 19 ක ඉඩම් කොටස මැණික් ගැරීම සඳහා වෙන්දේසි මගින් පැවරීමේදී අදාල අනුමැතීන් ලබාගෙන නොතිබුණි. |
| (ii) 18 (1) වගන්තිය | ඉඩමක "මැණික් ගැරීමේ අයිතිවාසිකම වෙන්දේසියකින් අත්කරගෙන ඇත්තාවූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ වෙන්දේසියේදී ගෙවන ලද මිලෙහි, ඒ ඉඩමෙන් ලැබෙන මැණික්වලට අදාළව යම් රාජ්‍යභාගයක්ද ඇතුළත් ලෙස සලකණු ලැබිය යුතුය" යන්න දක්වා තිබුණද, අධිකාරිය එම රාජ්‍යභාග ප්‍රතිශතයන් කුමක්ද යන්න තීරණය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉඩම් වෙන්දේසිවලින් රු. 24,277,611 ක පමණ ආදායමක් උපයා තිබුණද ඉන් කිසිදු රාජ්‍යභාග මුදලක් භාණ්ඩාගාරයට ලබා දී නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව එකතුව රු.1,192,800,281 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 137 | අනුමත නොකරන ලද රු.236,389 ක් වූ වවුචර් 02 ක් හා අනුමත අධිකාරී සීමාව ඉක්මවා අනුමත කර තිබූ රු.561,567 ක් වූ වවුචර් 02 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| ඈ) 2015 ජූනි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි උපරිම සීමාව වූ රු.100,000 ඉක්මවන අවස්ථාවලදී ඒ සඳහා භාණ්ඩාගාරයේ පූර්ණ අවසරය ලබාගත යුතු වුවත් එසේ අවසරය ලබාගැනීමකින් තොරව අවස්ථා 20 කදී රු.118,000 සිට රු.200,000 දක්වා පරාසය තුල එකතුව රු.3,484,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. තවද, අත්තිකාරම් ලබාදීමේදී අවශ්‍යතාවය සලකා බලා නොතිබූ අතර අවස්ථා 04 කදී ලබාගන්නා ලද රු.6,700 සිට රු.156,700 ක් වූ අත්තිකාරම් දින දින 5 සිට දින 22 දක්වා කාලයක් අත රඳවාගෙන මුළු මුදලම ආපසු පියවා තිබුණි. |

(ii) තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිමකල වහාම පියවිය යුතු වුවත් අධිකාරිය විසින් අවස්ථා 42 කදී ලබාදී තිබු රු. 2,564,330 ක අත්තිකාරම් දින 12 සිට දින 154 දක්වා කාලයක් ද, විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් අවස්ථා 06 කදී ලබාදී තිබු රු.950,000 ක අත්තිකාරම් පියවීම මාස 2 සිට මාස 5 දක්වා ද ප්‍රමාද වී තිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවු ගණුදෙනු**

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී අලුත් අවුරුදු දීමනා වශයෙන් සේවකයෙකුට රු.6,000 බැගින් වන සේ රු.1,578,000 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවක සුභසාධක සංගමය හරහා ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේදීද රු.1,600,000 ක් ගෙවා තිබුණු අතර විගණනයේදී පෙන්වා දුන්නද එය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.113,338,005 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.131,060,612 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.17,722,607 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ආදායම රු.29,189,561 කින් වැඩි වී තිබු අතර බදු වියදම රු.40,635,580 කින් අඩු වී තිබුණ ද ඉඩම් වෙන්දේසි ආදායම් හා පරීක්ෂණ සඳහා අයකිරීම් එකතුව රු. 89,703,638 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණද 2016 වර්ෂයේදී රු.43,939,388 ක ඌනතාවයක් ලබා තිබු අතර සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු.113,338,005 ක අතිරික්තයක් ලබා තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.273,309,778 ක්වූ දායකත්වය 2016 වර්ෂය වනවිට රු.263,205,729 ක් දක්වා අඩු වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට රු.292,969,699 ක් දක්වා නැවත වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්යසාධනය**

---------------

**4.1.1. සැලසුම් කිරීම**

----------------

**(අ) සංයුක්ත සැලැස්ම**

--------------------

(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.3 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය ඇතුළත් අධිකාරියේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

(ii) 1993 අංක 50 දරණ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 14 වගන්තියේ ඇතුළත් පහත සඳහන් කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

- කර්මාන්තයේ දියුණුව උදෙසා විශේෂයෙන්ම තාප පිරියම්කරණය හා මැණික් කැපීම පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීම හා දියුණු කිරීම.

- අනාගතයේ බලාපොරොත්තු විය හැකි මිලදී ගන්නන් අතර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

- මැණික් නීතිවිරෝධී ලෙස ශ්‍රී ලංකාවෙන් බැහැර කිරීම හා නීති විරෝධී මැණික් ගැරීම් නැවැත්වීම.

- ශ්‍රී ලංකාව තුළ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීම රජයේ දෙපාර්තමේන්තු අතර අවශ්‍ය සබඳතා ඇති කිරීම.

(ආ) අධිකාරියේ කාර්යභාරයට ඇතුළත් රන් ආනයනකරුවන් සඳහා පහසුකම් සැපයීම, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව සඳහා පහසුකම් සැපයීම හා ප්‍රවර්ධනය, රත්නදීප වෙළඳ කුටිය මෙහෙයවීම හා කළමනාකරණය කිරීම යන කාර්යයන් ඉටුකර ගැනීමට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) කාර්යසාධන වාර්තාවේ මැණික් අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීමේ උපක්‍රියාකාරකම්වල ප්‍රගතිය වෙන වෙනම දක්වා නොතිබුණු අතර අධිකාරියේ නීතිමය යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම හා කාර්යමණ්ඩල කාර්යසාධන ඇගයීම යන ක්‍රියාකාරකම්වල කාර්යසාධනය වාර්තා කර නොතිබුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය පරීක්ෂාකිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 4.2 ප්‍රකාරව අධිකාරියේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුමත අයවැය ඇස්තමේන්තුවට අනුකූල වන ආකාරයට පිළියෙල කර නොතිබුණි.

**4.1.2. ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට වර්ෂය තුල ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරකම් 46 ක් හඳුනාගෙන තිබුණ ද එයින් රු.268,920,000 ක් වැයකර ඉටුකළ යුතු ක්‍රියාකාරකම් 04 ක් සහ වටිනාකම ඇස්තමේන්තු කර නොතිබූ ක්‍රියාකාරකම් 3 ක් වර්ෂය තුල ඉටු කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට නිමකිරීමට සැලසුම් කල ක්‍රියාකාරකම් 7 ක් නිම කර නොතිබූ අතර ඒවායේ භෞතික ප්‍රගතිය සියයට 56 සිට 88 ක් දක්වා විය.

(ආ) වර්ෂය තුළ වෙන්දේසි කිරීමට සැලසුම් කල මැණික් ඉඩම් සංඛ්‍යාව 10 ක් වුවද ඉඩම් 4 ක් සහ ඉල්ලම් වෙන්දේසි 24 ක් සිදුකර තිබූ නමුත් අපේක්ෂිත මූල්‍ය කාර්යසාධනය ලඟාකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ නව වෙළඳපලවල් සොයාගැනීම හා වෙළඳපලවල් තහවුරු කර ගැනීම් යටතේ විදේශ ප්‍රදර්ශන 16 ක් සහ දේශීය ප්‍රදර්ශන 05 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණු අතර විදේශ ප්‍රදර්ශන 15 ක් සහ දේශීය ප්‍රදර්ශන 12 ක් පවත්වා තිබුණි. එසේ වුවද සොයාගත්/ තහවුරුකරගත් නව වෙළඳපලවල් පිළිබඳ තොරතුරු දක්වා නොතිබු අතර පවත්වා තිබු දේශීය ප්‍රදර්ශන ද අදාල අරමුණ ළඟාකර ගැනීමට ඉවහල් වී ඇති බවට තොරතුරු ඉදිරිපත් නොවුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් මැණික් ගැරීම සඳහා ඉඩම්වල අයිතිය පවරා දීම, භාරදී ඇති මැණික් විකිණීම සඳහා වෙන්දේසි කිරීම, ඉඩම් වෙන්දේසි කිරීමේදී ඉඩම් කැබැල්ලක අවම ලංසු මිල තීරණය කිරීම හා වෙන්දේසි කරන මැණික් ගල්වල අගය තක්සේරු කිරීම සුදුසුකම් ලත් කමිටුවක් විසින් සිදුකර නොතිබුණි.

(ආ) තේ පර්යේෂණායතනය සතු රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ අක්කර 04, රූඩ් 02, පර්චස් 19 ක ඉඩම් කොටස අධිකාරිය විසින් මැණික් ගැරීම සඳහා වෙන්දේසි කිරීමේදී පාරිසරික අනුමැතියක් ලබාගෙන නොතිබුණි. වෙන්දේසියෙන් පසු ඉතිරි වූ ඉඩම් කැබලි 04 ක් මිල ගණන් කැඳවා අලවිකර තිබුණද, ඒ සඳහා ඉඩම් හිමිකරු වූ තේ පර්යේෂණායතනය වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර වෙන්දේසියෙන් පසු සිදුකල ඉඩම් විකුණුම්, කමිටුවක් මගින් සිදුකළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් වෙන්දේසි සඳහා මැණික් ගල් තක්සේරු කිරීමේදී තක්සේරු මිල හා අලෙවි මිල අතර සියයට 20 ක විචලතාවයක් පැවතීම සාමාන්‍ය තත්ත්වයක් ලෙස සලකා කටයුතු කර තිබුණි. එහෙත් සීතාවක ගඟ ව්‍යාපෘතියේ මැණික් ගල් ලොට් 57 ක් වෙන්දේසි කිරීමේදී ලොට් 43 ක මිල විචලනය සියයට 110 සිට සියයට 1,168 දක්වා පරාසයක විය.

(ඇ) ඉල්ලම් අලවිකිරීමේ හා ගැරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------------

දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් මතුවන මැණික් ඉල්ලම් අධිකාරිය භාරයට ගෙන වෙන්දේසි කිරීම් 24 ක් සිදුකර තිබූ අතර ඒ තුළින් රු.20,152,755 ක ආදායමක් උපයා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අවස්ථා ගණනාවකදී වෙන්දේසිවල නොවිකිණී ඉතිරි වූ ඉල්ලම් තොගවල අවම ලංසු මිල අඩුකර නැවත වෙන්දේසි කර තිබුණද ඒ සඳහා මිල තීරණය කිරීමේ කමිටුවක අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) කජුවත්ත මාටුවාගල මාර්ගයෙන් මතු වූ ඉල්ලම් තොගයෙන් වෙන්දේසි නොවූ ලොට් 09 ක් සේදීමට බාහිර ව්‍යවසායකයෙකු තෝරා ගෙන තිබූ අතර එම ව්‍යාපෘතියට තැබිය යුතු අවම ලංසු මිල සාධාරණ හේතු දැක්වීමකින් තොරව රු.75,000 සිට රු.10,000 දක්වා අඩු කිරීමට සභාපතිවරයා කටයුතු කර තිබුණි.

(iii) ඉවත්කරගනු ලබන ඉල්ලම් සේදීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටුකිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(iv) උඩවලව ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ මත්ස්‍ය පොකුණු ඉදිකිරීමේදී ඉවත් කරනු ලබන ඉල්ලම් ගැරීමේ දීර්ඝකාලීන ව්‍යාපෘතියක් සඳහා රු.1,600,100 කට ව්‍යවසායකයෙකු තෝරාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එහෙත් ඒ සඳහා එම ඉඩමේ අයිතිය සතුව පැවති ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර සංවර්ධන කටයුතු වලදී ඉවත් කෙරෙන ඉල්ලම් පස් පමණක් අධිකාරියට ලබාදීමට ගිවිසුම්ගතව තිබුණද, විශාල ප්‍රදේශයක කැණීම් සිදුකර මැණික් ගැරීම් සිදුකර තිබුණි. එම කැණීම් කටයුතු සඳහා 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 14( උ) වගන්තිය ප්‍රකාර ඉඩම් අමාත්‍යවරයාගේ හා පරිසර විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

(v) ඉල්ලම් ගැරීම් ව්‍යාපෘතිවල ශුද්ධ ආදායම අධිකාරිය හා ව්‍යවසායක පාර්ශවය අතර බෙදීම සම්බන්ධයෙන් අනුමත නිශ්චිත ක්‍රමවේදයක් නොතිබූ අතර උඩවලව මැණික් ගැරුම් ව්‍යාපෘතියෙන් ලැබී 2016 දෙසැම්බර් 17 දින සිට අවස්ථා 31 කදී බැංකුවේ තැන්පත් කර තිබූ ක්‍රාත් 1417.83 ක් බර මැණික් ගල් වෙන්දේසි කර ආදායම් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2009 වර්ෂයේ දී රසායනාගාරයක් ආරම්භ කිරීම වෙනුවෙන් මැණික් අපනයනකරුවන්ගේ හා අධිකාරියේ රු.92,948,578 ක ප්‍රාග්ධන දායකත්වයකින් යුතු පෞද්ගලික සමාගමක් ස්ථාපිත කර තිබුණද විගණිත දිනය වූ 2018 මැයි 04 දින දක්වාම සමාගම ලියාපදිංචි කිරීම පමණක් සිදුකර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වනවිට පෞද්ගලික සමාගම නමින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ මුදල රු.139,612,000 ක් වූ අතර 2016 අගෝස්තු 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, එම අරමුදල් අධිකාරිය වෙත නැවත ලබාගැනීමට සහ අමාත්‍ය මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකර නොතිබුණි.

(ඊ) කළු ගඟ හැරනියාවක මැණික් ගැරීම් ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ, වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ, මාර්ග සංවර්ධන අධිකාරියේ හා අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2017 අගෝස්තු 10 දින ව්‍යවසායකයෙකු තෝරා ගැනීමට කටයුතු කර තිබුණි.

(උ) අධිකාරියේ අරමුණක් වූ ලංකාවෙන් පිටත මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳපල පුළුල් කර ගැනීම සඳහා විදේශ ප්‍රදර්ශනවලට අපනයන කරුවන් සහභාගි කරවීම සිදු කළ යුතු වූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ අපනයන ප්‍රදර්ශන 14 ක් පවත්වා රු.මිලියන 75.3 ක් වියදම් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) අපනයනකරුවන් විදෙස් ප්‍රදර්ශණවලට සහභාගී කරවීම තුළින් මැණික් අපනයන ආදායම සත්‍ය වශයෙන් වැඩිවී ඇත්ද යන්න පරීක්ෂා කර බැලීමට හා විකුණුම්වල නිවැරදිභාවය තහවුරු කරගැනීමට ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් එම වියදමෙහි ඵලදායීත්වය තහවුරු කර ගත නොහැකි විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ පැවැත්වූ විදේශ මැණික් ප්‍රදර්ශන 14 සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන් 167 දෙනෙකු සහභාගී වී තිබූ අතර ඔවුන් ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කර තිබූ මැණික් ගල්වල තක්සේරු වටිනාකම (FOB) රු.මිලියන 21,053 ක් විය. මෙම මැණික් ගල්වලින් රු.මිලියන 2,355 ක තක්සේරු වටිනාකම ඇති මැණික් ගල් අලවි කර තිබූ අතර එමගින් අධිකාරියට ලැබී තිබූ ආදායම රු.මිලියන 11.6 ක් පමණක් වුවද, මෙම ප්‍රදර්ශන සඳහා අධිකාරියේ අරමුදලින් රු.මිලියන 22.7 ක් වැයකර තිබුණි.

(iii) 2017 අපනයන ප්‍රවර්ධන සැලැස්මෙහි ඇතුළත් විදේශ ප්‍රදර්ශන 2 ක් සඳහා අපනයනකරුවන් සහභාගීකරවීමට අධිකාරිය කටයුතු කර නොතිබූ අතර සැලසුමේ ඇතුලත් නොවූ ප්‍රදර්ශනයක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද රහිතව රු.2,230,817 ක් වැයකර ඉන්දුනීසියාවේ පවත්වා තිබුණි.

(iv) පවත්වා තිබූ ප්‍රදර්ශන 4 කට ඇස්තමේන්තුකර තිබූ පරිදි අපනයනකරුවන්ගේ දායකත්වය ලබා නොගැනීම හේතුවෙන් රු.990,752 ක් අධිකාරියට වැඩිපුර වැය කිරීමට සිදුව තිබූ අතර ප්‍රදර්ශන 3 ක ඇස්තමේන්තුව ඉක්මවා රු.6,361,362 ක් වැඩිපුර වැයකර තිබුණි.

(v) අධිකාරිය විසින් ප්‍රදර්ශන 4 ක් සඳහා රු.12,942,385 ක් වැයකර තිබුණද, ඊට සහභාගී වී තිබුණේ අපනයනකරුවන් 13 දෙනෙකු පමණක් වූ අතර එක් ප්‍රදර්ශනයක් සඳහා එක් අපනයනකරුවෙකු හෝ සහභාගී වී නොතිබුණි.

(vi) අපනයනකරුවන් 71 දෙනෙකු සහභාගී වී තිබූ ප්‍රදර්ශන 2 ක් සඳහා අපනයනකරුවන්ගෙන් වැඩිපුර දායකත්වයක් ලබා නොගැනීම හේතුවෙන් රු.7,457,740 ක් වූ මුළු වියදමෙන් රු.4,981,650 ක් අධිකාරියට වැයකිරීමට සිදුව තිබුණි.

(vii) විදේශ ප්‍රදර්ශන සඳහා අධිකාරියේ නිලධාරීන් සහභාගී කරවීමට නිසි ක්‍රමවේදයක් නොතිබූ අතර එකම නිලධාරීන් පිරිසක් සහභාගී කරවා තිබුණි. එහිදී නිලධාරීන් 04 දෙනෙකු 2016 හා 2017 වර්ෂ තුළ ප්‍රදර්ශන 5 ත් 7 ත් අතර සංඛ්‍යාවකට සහභාගී වී තිබුණි. තවද 2017 ජූනි මස චීනයෙහි පැවැත්වූ එක් ප්‍රදර්ශනයක් සඳහා නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් රු.1,654,400 ක් වැනි ඉහළ වියදමක් අධිකාරිය මගින් දරා තිබුණි.

(viii) විදේශ ප්‍රදර්ශන ඉකුත් වර්ෂයේ සැලසුම්කර තිබුණද ගුවන්යානා ආසන කල්තියා වෙන්කර නොගැනීම හේතුවෙන් චීනයේ හා ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වූ ප්‍රදර්ශන සඳහා සාමාන්‍ය ගාස්තුවට සාපේක්ෂව රු.441,374 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය සඳහා දිරිදීමනා ලෙස ඇස්තමේන්තුගත ලාභය පදනම් කර නොගෙන රු.22,000,000 ක් වෙන් කිරීම් කර තිබුණු අතර 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 ප්‍රකාරව ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ද නොතිබුණි.

(එ) 1993 අංක 50 දරණ පනතින් අධිකාරිය පිහිටුවා වසර 24 ක් ගතවී තිබුණද අවශ්‍ය කාලීන සංශෝධනයන් ඇතුළත් කර පනත සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

2007 වර්ෂයේ අයවැය යෝජනා මගින් ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය හා අභිවෘද්ධිය සඳහා ඇතිකරන ලද ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල සඳහා ස්වර්ණාභරණ කාර්මිකයන්ගෙන් වාර්ෂිකව අයකරනු ලබන රු.5,000 ක ලියාපදිංචි ගාස්තුවෙන් මුදල් රැස් කර තිබුණද, 2012 හා 2013 වර්ෂවල සිදුකල රු.3,793,470 ක් වූ වැය කිරීම් හැර වෙනත් කිසිදු කාර්යයක් මෙම අරමුදලින් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේ දී එහි ශේෂය රු.65,740,000 ක් විය.

## 4.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීතාවක ගඟ මැණික් ගැරීමේ ව්‍යාපෘතියේ ඉල්ලම් සේදීම සඳහා රු.907,500 කට මිලදී ගෙන තිබූ යන්ත්‍රයක් හා එම ව්‍යාපෘතියේ භාවිතය සඳහා රු.303,148 කට මිලදී ගෙන තිබූ ෆයිබර් බෝට්ටුවක් 2017 මාර්තු සිට භාවිතයෙන් තොරව අනාරක්ෂිතව තබා තිබුණි.

(ආ) ගාල්ල රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ රසායනාගාරයේ පවතින රිදී භාණ්ඩ මුද්‍රා තැබීමේ යන්ත්‍රයක් 2015 වර්ෂයේ සිට නිශ්කාර්යව තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/Policy/3 හා 2013 නොවැම්බර් 01 දිනැති ලිපිය මගින් සංශෝධිත පරිදි අධිකාරියේ තනතුරු සඳහා නව බඳවාගැනීම් පරිපාටි සංශෝධනය කරගන්නා ලෙස දන්වා තිබුණද, එසේ සංශෝධනය කර නොතිබුණි. තවද, සමස්ත ආයතනය සඳහා බඳවාගැනීමේ පරිපාටි එකවර අනුමත කරවාගෙන නොතිබුණු අතර වරින්වර අනුමත කරවා ගැනීම තුළින් තනතුරු හා සුදුසුකම් විධිමත්ව හා ගැළපීමක් සහිතව පවත්වා ගැනීමට නොහැකිව තිබුණි.

(ආ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/E 2 /33/7/213/3 දරන 2011 නොවැම්බර් 03 දිනැති ලිපිය ප්‍රකාරව නව බඳවාගැනීම් සිදුකල යුත්තේ බඳවාගැනීමේ පරිපාටි අනුමතකර ගැනීමෙන් පසුව වුවද තනතුරු 04 ක් සඳහා බඳවා ගැනීමෙන් පසුව බඳවා ගැනීමේ පටිපාටි අනුමත කර තිබූ අතර එසේ අනුමත කර ගැනීමකින් තොරව තනතුරු 03 කට අදාලව නිළධාරින් 13 ක් බඳවා ගෙන තිබුණි.

(ඇ) අධිකාරියේ තනතුරුවලට අදාළව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින් සේවකයන් බඳවාගෙන තිබුණද, සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු ලබාදීමේ පරිපාටිය විනිවිදභාවයෙන් යුතුව විස්තරාත්මකව සකස්කර අනුමත කර නොතිබුණි. මේ හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට අභිමතය පරිදි කටයුතු කළ හැකිව තිබුණි.

(ඈ) ප්‍රචාරක නිලධාරී තනතුර සඳහා අයදුම්කරුවන් 09 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට ලක්කර තිබූ නමුත් මූලික සුදුසුකම් නොමැති අයෙකු තනතුර සඳහා පත්කරගෙන තිබුණි. සම්මුඛ පරීක්ෂණයේදී තෝරාගත් අයදුම්කාරියට සේවා පළපුරුද්දක් නොතිබියදී ඒ සඳහා ලකුණු 15 ක් ද වෙනත් සුදුසුකම් නොතිබියදී ඒ සඳහා ලකුණු 03 ක් ද ලබාදී තිබීම මතභේදයට තුඩු දී තිබුණි.

(ඉ) සහකාර අධ්‍යක්ෂ (ඉඩම් හා ප්‍රාදේශීය සංවර්ධන) තනතුරුවලට අදාල බඳවාගැනීමේ සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරීන් 05 දෙනෙකු එම තනතුරට උසස් කර තිබූ අතර සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) තනතුරට බඳවාගැනීම සඳහා 2015 මැයි 22 දින අදාළ අනුමැතිය ලබාදී තිබුණද බඳවා ගැනීම් සිදු කිරීමකින් තොරව වසර 02 කට අධික කාලයක සිට සහකාර කළමනාකරු (සැපයුම්) නිලධාරිනිය එම තනතුරේ රාජකාරී ඉටුකරමින් පැවතුණි. තවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 (vii) වගන්තිය ප්‍රකාරව වැඩ බැලීම සඳහා පත්කල යුත්තේ මාස 03 ක් සඳහා පමණක් වුවද ඊට පටහැනිව වසරකට අධික කාලයක සිට පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (අපනයන) තනතුරේ වැඩබැලීම අධ්‍යක්ෂ (ඉඩම්, පරිසර හා කැණීම්) විසින් සිදුකර තිබුණි.

(ඊ)	අධිකාරියේ සේවයට බඳවාගෙන තිබූ නිලධාරීන් ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික අදාල ආයතනවලින් තහවුරු කරගෙන නොතිබුණි.

(උ)	විධායක නොවන මට්ටමේ නිළධාරින්ට උසස්වීම්, පුහුණුවීම්, හා වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේ දී වාර්ෂිකව කාර්යසාධනය ඇගයීමට ලක් කළයුතු වුවත් ඒ සඳහා පියවරගෙන නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

---------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

---------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින නමුත් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථයට අදාල කාර්යයන් සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත වාර්ෂික වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාල අධිකාරියේ අනුමත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 03 දින වූ අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණිත දින වූ 2018 මැයි 04 දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

**6.2 අභ්‍යන්තර විගණනය**

----------------------

2017 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම මගින් පරීක්ෂා කිරීමට ඉලක්ක කර තිබූ පරීක්ෂණ කාර්යන් 19 ක් වර්ෂය තුල ඉටු කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 133(2) ප්‍රකාර අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනයේ ගිණුම් වාර්තා, උපලේඛණ හා සටහන්වල විශ්වාසදායකත්වය පරික්ෂා කළ යුතු වුවද ඒ සම්බන්ධ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

**6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

----------------------------------------

**6.3.1 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ)	අධිකාරියේ ක්‍රියාත්මක කිරීමට යෝජිත, ප්‍රධාන කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම, දෙමුවාවක ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සහ කතරගම නිවාඩු නිකේතනයක් ඉදිකිරීම යන රු.මිලියන 1,593 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකවරුන්

තෝරාගත යුතු වුවත් ඊට පටහැනි ලෙස අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මඟින් කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකවරුන් තෝරා ගැනීමට සහ අනුමැතිය ලබා ගැනීමට යොමුවී තිබුණි.

(ආ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රසම්පාදනයට අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත වීමට පෙර ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයට වැඩ පූර්ව අත්තිකාරම් ලෙස රු.2,300,000 ක් ගෙවා තිබුණි.

(ඇ) රත්නපුර දෙමුවාවක මැණික් වීදියක් ඉදිකිරීම සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට ප්‍රථම රත්නපුර ප්‍රාදේශීය ලේකම්ට අයත් ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට හා එහි පැවති කාර්යාලයක් අධිකාරියේ ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.2,819,258 ක වියදමක් දරා තිබුණි.

### 6.3.2 කොන්ත්‍රාත් ක්‍රියාවලියේ අඩුපාඩු

(අ) ඇහැළියගොඩ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම

ඉහත කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 මාර්තු 06 දින ගිවිසුමකට එළඹ රු.මිලියන 180.97 කට සුහසිංහ කන්ට්‍රැක්ටර්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අදාල ඉදිකිරීම් ස්ථානයේ පසෙහි ස්වභාවය අනුව ගොඩනැගිල්ල සඳහා පහුරු පදනම මත වූ අත්තිවාරමක් යෙදීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ භූ භෞතික අංශය නිර්දේශ කර තිබුණද පසුව එම අංශය විසින්ම අදාළ පහුරු පදනම මත වූ අත්තිකාරම් වෙනුවට විකල්ප ලෙස කුළුණු මත අත්තිවාරම් යෙදීම අනුමත කර ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණි.

(ii) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 199.97 ක් වුවද භූමියේ ස්වභාවය අනුව ඉදිකිරීමට නියමිත කුළුණු 42 න් 15 ක් නියමිත ආකාරයෙන් ඉදිකිරීමට නොහැකිව තිබූ අතර අඩු ශ්‍රේණියේ කොන්ක්‍රීට් යොදා භූමිය තද කර නැවත කුළුණු ඉදිකිරීමට සිදුවී තිබුණි. මේ හේතුවෙන් දැරීමට සිදුවන අතිරේක පිරිවැය රු.මිලියන 35.8 ක් විය. එම නිසා සම්බන්ධිත මුළු පිරිවැය රු.මිලියන 235.77 ක් වූයෙන් ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 8.13.4 ප්‍රකාරව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) ඉදිකිරීම සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිදුකර තිබූ නිර්දේශ ප්‍රකාරව අත්තිවාරම් සැලසුම වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකු විසින් සිදුකල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් එම අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉදිකිරීම් 2017 අප්‍රේල් 04 දින ආරම්භ කර තිබුණි.

(v) ඉදිකිරීමට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කළ ඉදිකිරීම් කටයුතු පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට උපදේශන සේවාව ලබාදී තිබූ අතර ඒ අනුව ඇස්තමේන්තුවෙන් සියයට 4.85 ක ප්‍රතිශතයක් වන ආකාරයට උපදේශන ගාස්තු සඳහා එකඟ වී තිබුණි. එළඹ තිබූ ගිවිසුම අනුව ගෙවිය යුතු උපදේශන ගාස්තුව රු.මිලියන 6.62 ක් වුවත් රු. මිලියන 9.7 ක උපදේශන ගාස්තුවකට අදාල කාර්ය පැවරීමට කටයුතු කර තිබුණි.

(ආ) මැණික් හා ස්වර්ණාභරණ පරීක්ෂා කිරීමේ ජංගම රසායනාගාරයක් ස්ථාපිත කිරීම

---

(i) ජංගම රසායනාගාරයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පිරිවිතර ඇතුළත්ව විශේෂිතව සැකසූ රථයක් ආනයනය කර ගැනීම වෙනුවට රු.7,200,000 කට ආසන රහිත සාමාන්‍ය මගී රථයක් මිලදී ගැනීමට හා මිලදී ගත් රථය රු.2,456,500 ක් වැයකර රසායනාගාරයක් බවට පත් කිරීමට කටයුතු කර තිබුණි. එහෙත්, ස්වර්ණාභරණ පරීක්ෂා කිරීමේ උපකරණ සවි නොකිරීම, රථයේ පසුපසට වායුසමනය නොමැතිවීම, බාහිර විදුලි බලය ලබාගත යුතු වීම, පරිවර්තන දෝෂ පැවතීම යන හේතු නිසා රසායනාගාරයක් සඳහා අවශ්‍ය ප්‍රමිතිය, ගුණාත්මකබව හා පහසුකම් පවත්වාගැනීමට අසමත්ව තිබුණි.

(ii) රසායනාගාරයක් බවට පත් කිරීමේදී, රථයේ පැවති රු.1,500,000 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත වායුසමීකරණ යන්ත්‍රය ගලවා ඉවත්කර තිබුණි. ඉවත් කල යන්ත්‍රය නිසි තත්ත්වයෙන් යුතුව අධිකාරියට ලබාගෙන නැවත ප්‍රයෝජනයට ගැනීමට හෝ ස්වාභාවිකව සිදුවන අගය අඩුවීම වළක්වා ගැනීමට ඉක්මනින් අපහරණ කර උපරිම වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2018 මැයි 04 වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව රඳවුම් මුදල් තබාගැනීමෙන් තොරව බස් රථය රසායනාගාරයක් බවට පරිවර්තනය කිරීමෙන් පසු ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) සේවා ගිවිසුම්වලට එළඹීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 ප්‍රකාරව වාර්ෂිකව කළ යුතු වුවද, 2014 වර්ෂයේ වායුසමීකරණ අලුත්වැඩියා සඳහා ඇතිකරගත් ගිවිසුම් මත ඊට පසු වර්ෂවලද රු.438,918 ක් වූ අලුත්වැඩියා සිදුකරගෙන තිබුණි.

**6.4 අයවැය පාලනය**

---

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 22 සිට 1112 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6.5 නොවිසඳී ඇති විගණන ඡේද**

---

ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තියට පටහැනිව වයස අවුරුදු 60 ඉක්මවූ නිළධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් 2012 ඔක්තෝබර් සිට කොන්ත්‍රාත් පදනම යටතේ උපදේශකවරයෙකු ලෙස බඳවාගෙන තිබුණි.

**6.6 පරිසර හා සමාජ වගකීම් ඉටු කිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) අධිකාරියේ ඍජු මැදිහත්වීම මත ක්‍රියාත්මක කර තිබූ සීතාවක ගඟ මැණික් ගැරීමේ ව්‍යාපෘතියේ අදියර III සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර තිබූ කොන්දේසි 22 න් කොන්දේසි 10 ක් අධිකාරිය විසින් උල්ලංඝනය කර තිබුණි. ඒ හේතුවෙන්, 2016 ඔක්තෝබර් 11 සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මධ්‍යම පරිසර අධිකාරිය විසින් අත්හිටුවා තිබුණද, අත්හිටුවීමෙන් පසුද මාස 5 ක් ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක කර තිබුණි. තවද ව්‍යාපෘතියේ කැණීම් කටයුතු හේතුවෙන් බාදනය වී ඇති සීතාවක ගඟේ වම් ඉවුර යථා තත්ත්වයට පත්කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික උපදෙස් යටතේ සිදුකල යුතු බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් අධිකාරිය වෙත දැනුම් දී තිබුණද, ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) අවිධිමත් ලෙස අත්හරින ලද පතල් වලවල්වල පුනරුත්ථාපන කටයුතු දුර්වල මට්ටමක වූ අතර විගණනයට භාජනය වූ පතල් වලවල් 10 ක් වැසීමේ කොන්ත්‍රාත්තු වලින් 5 ක් වැසීමට කටයුතු කර නොතිබුණි.

## 07. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ආදායම් බදු අධි වෙන්කිරීම් ගිණුම්වලට නොගැළපීම. |
| | (ii) භාවිතා කරන සියළු ස්ථාවර වත්කම් නිවැරදි අගය මත ගිණුම්ගත නොකිරීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | (i) මැණික් ගැරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මැණික් අඩංගු පෙට්ටිය විවෘත කිරීම සඳහා සිටිය යුතු අධීක්ෂණ මණ්ඩලය පිළිබඳ තීරණය කර නොතිබීම. |
| | (ii) සහභාගී වූ අධීක්ෂණ නිලධාරීන් පිළිබඳව, මැණික් අඩංගු පෙට්ටිය විවෘත කිරීම හා මැණික් බැංකුවේ තැන්පත් කිරීම පිළිබඳ නිසි වාර්තාකරණයක් සිදුකර නොතිබීම. |
| | (iii) වෙන්දේසි කරනු ලබන මැණික් ගල් තක්සේරුව සඳහා කාණ්ඩ කිරීම, තක්සේරු කිරීම හා වෙන්දේසි කිරීම සඳහා නිලධාරීන් විධිමත්ව පත් නොකිරීම, ඒ පිළිබඳ වාර්තා තබා නොගැනීම හා ලේඛනවල අත්සන් තැබීම විධිමත්ව සිදුකර නොතිබීම. |
| | (iv) අපනයනකරුවන් ප්‍රදර්ශන සඳහා මැණික් ගල් රැගෙන යාමේදී අපනයනකරු විසින්ම මැණික්ගල්වල වටිනාකම තීරණය කිරීම හා ලබාගන්නා රක්ෂණ සහතිකයේ පිටපත් අධිකාරියට ලබාගෙන නොතිබීම. |
| | (v) රැගෙන යන මැණික්වල වටිනාකම අනුව කළමනාකරණ ගාස්තු අය කර නොතිබීම. |
| | (vi) අපනයනකරුවන් ප්‍රදර්ශන සඳහා රැගෙන ගිය මැණික් ගල් ආපසු රැගෙන පැමිණිවිට ඒ රැගෙන ගිය මැණික්ම බවට රේගුව සහ රසායනාගාරය මුද්‍රාව තබා සහතික කර නොතිබීම. |
| | (vii) එක් එක් අපනයනකරු සඳහා වෙන වෙනම ලිපිගොනු නඩත්තු කර නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අත්තිකාරම් පාලනය | (i) | චෙක්පත් මගින් සිදුකළ යුතු ගෙවීම් සඳහා අත්තිකාරම් ලබා දී තිබීම. |
| | | (ii) | අත්තිකාරම් පියවීම් වවුචර්වල පියවූ දිනය, අත්තිකාරම් මුදල හා නිලධාරියාගේ නම සටහන් නොවූ අවස්ථා පැවතීම හේතුවෙන් වවුචර් අසම්පූර්ණ වීම. |
| | | (iii) | අත්තිකාරම් ලේඛණය නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඈ) | වාහන පරිපාලනය | | අධිකාරියේ වාහන 13 කට අදාල ධාවන සටහන් හා වාහන ලොග් සටහන් පොත් නිසි පරිදි නඩත්තු කර නොතිබීම. |
| (ඉ) | කාර්යමණ්ඩල පරිපාලනය | (i) | බඳවාගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| | | (ii) | නිලධාරීන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කර නොගැනීම. |
| | | (iii) | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේදී කාර්යසාධනය ඇගයීමට ලක් නොකිරීම. |